**විසර්ජන ශීර්ෂය 261 - ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

## 1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(i) ජාතික මට්ටමේ හා දිස්ත්‍රික් මට්ටමේ සංස්කෘතික, ආගමික හා වෙනත් කාලීන රාජ්‍ය උත්සව සංවිධානය කිරිමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම.

(ii) සියළුම මැතිවරණ කටයුතු එනම් ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා මැතිවරණය හා පළාත් පාලන මැතිවරණ වලදී මැතිවරණ කොමසාරිස්ගේ නියෝජිතයා වශයෙන් දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරි ලෙස ක්‍රියා කරමින් සාධාරණ හා අපක්ෂපාතී මැතිවරණ පැවැත්වීමට ක්‍රියා කිරීම.

(iii) දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුව, දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ ලේකම් වශයෙන් ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සැලසුම් කිරිම, සංවිධානය කිරිම, ක්‍රියාත්මක කිරිම හා අධීක්ෂණය කිරීම.

(iv) දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම්වරුන් 19 දෙනා සමඟ ප්‍රාදේශීය පරිපාලන කටයුතු මෙහෙය විමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරිම.

(v) විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු, සම්බන්ධ ආදායම් ගණන් දීමේ නිලධාරින් වෙනුවෙන් ඔවුන්ගේ ආදායම් එක් රැස් කිරිම, ගිණුම් ගත කිරිම හා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරිම හා අදාල ආදායම් ගණන් දිමේ නිලධාරින් දැනුවත් කිරිම.

(vi) දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ සියළුම රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල නියෝජ්‍ය ප්‍රධානියා ලෙස ක්‍රියා කරමින් ඒ ඒ දෙපාර්තමේන්තු වල අරමුණු, පරමාර්ථ හා කාර්යයන් ඉටු වන පරිදි සම්බන්ධිකරණ කටයුතු කිරිම.

(vii) නියඟ, ගංවතුර, සුළිසුළං, මුහුද ගොඩ ගැලිම වැනි විස්තීර්ණ ආපදා අවස්ථාවන්හිදි රජයේ නියෝජිතයා ලෙස ක්‍රියා කරමින් ආපදා කළමනාකරණ කටයුතු සංවිධානය කිරිම, ක්‍රියාත්මක කිරිම, අධීක්ෂණය හා පසු විපරම් කටයුතු කිරිම තුලින් ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරිම හා ස්ථාවර කිරිම.

(viii) දිස්ත්‍රික්කය තුළ ඉඩම් ඔප්පු , උප්පැන්න, මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කටයුතු සම්බන්ධිකරණය කිරීම.

(ix) දිස්ත්‍රික්කය තුළ විශ්‍රාම වැටුප් වැඩ සටහන සම්බන්ධීකරණය කිරීම.

## 1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

(අ) ගාල්ල කඩවත්සතර
(ආ) තවලම
(ඇ) නියාගම

(ඇ) අම්බලන්ගොඩ
(ඉ) කරන්දෙනිය
(ඊ) ඇල්පිටිය
(උ) නෙළුව
(ඌ) නාගොඩ
(එ) බලපිටිය
(ඒ) හික්කඩුව
(ඔ) අක්මීමන
(ඕ) බෙන්තොට
(ක) හබරාදුව
(ග) බද්දේගම
(ච) යක්කලමුල්ල
(ජ) බෝපේ පෝද්දල
(ට) වැලිවිටිය
(ඩ) ඉමදුව
(න) ගෝනපීනුවල

## 1.3 විගණන විෂය පථය

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 සැප්තැම්බර් 05 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම්, සහ සොයා ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර

පාලනයන් සැලසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.5 විගණන නිරීක්ෂණ**

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.8 දක්වා ඡේදවල දක්වා ඇති ප්‍රධාන විගණන සොයා ගැනිම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛණ හා පොත්පත් පවත්වා නොතිබිම**

ස්ථාවර තැන්පත් සහතික ආදී වූ අවශ්‍ය සාක්ෂි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි නොතිබිම නිසා එකතුව රු.1,026,072ක මුදලකට අදාල වූ ගනුදෙනු 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**(ආ) විසර්ජන ගිණුම**

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.922,425,763 ක් වූ අතර වර්ෂය අවසාන වන විට ඉන් රු. 91,549,108 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.6,934,655 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.75 ක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 611,975,000 | 862,625,763 | 674,209 | 0.08 |
| මුලධන | 59,800,000 | 59,800,000 | 6,260,446 | 10.47 |
| එකතුව | 671,775,000 | 922,425,763 | 6,934,655 | |

**(ii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 22 ක් හා දෙපාර්තමේන්තු 15 ක් විසින් එකතුව රු.4,099,032,889 ක්වූ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඉන් රු.3,731,860,150 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ඉතිරිවීම් රු.367,172,734 ක් වී තිබුණු අතර එය ලැබී තිබුණු ප්‍රතිපාදන වලින් සියයට ක් ගෙන තිබුණි. දිවිනැගුම වැඩ සටහන යටතේ 2012 - IV වන අදියර යටතේ ග්‍රාම නිලධාරි වසම් 44 ක් සඳහා එළවළු බීජ පැකට් 9,694 ලබා දී තිබූ අතර ඉන් බීජ පැකට් 6165 ක් පමණක් වගාකර තිබුණි. ලබාදුන් ප්‍රමාණයෙන් එය සියයට 64 ක් වන අතර වගාකළ බීජ ප්‍රමාණයෙන් ඉතා හොඳ තත්ත්වයේ පැවැතියේ ප්‍රතිලාභින් 77 දෙනෙකුගේ පමණක් වන අතර එය වගාකළ ප්‍රමාණයෙන් සියයට 1.25කි. මේ අනුව දිවිනැගුම වැඩසටහන යටතේ බීජ පැකට් ලබාදීමේ ව්‍යාපෘතිය අපේක්ෂිත මට්ටමේ සාර්ථකත්වයක් ළඟා කර ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

**(iii) රාජ්‍ය වියදම් කළමනාකරණය**

2012 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද වාර්ෂික ඇස්තමේන්තු මගින් සලසා තිබුණු ප්‍රතිපාදන වලින් 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව අයවැය ඇස්තමේන්තුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදන වලින් පුනරාවර්තන හා මූලධන වියදම්වලට අදාළව පිළිවෙලින් සියයට 2 ක් හා සියයට 9 ක ප්‍රතිපාදන ඉතිරි කළ යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නියමිත පරිදි පුනරාවර්තන වියදම් වලින් ඉතිරි කිරීම් කර නොතිබුණි.

**(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තු විසින් පනවා තිබුණු සීමාවන්**

විෂය අංක 26101 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 51,000,000 | 47,114,743 | 44,000,000 | 46,387,985 | 220,000,000 | 196,920,280 |

**(ඈ) අග්‍රිම ගිණුම්**

2013 අප්‍රේල් 30 දින වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පියවා නොතිබුණු අග්‍රිම ශේෂ එකතුව රු. 194,086 ක්වූ අතර එය 2006 වර්ෂයේ සිට පැවත එමින් තිබුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම්**

2012 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුම් වල ශේෂවල එකතුව රු. 368,496 ක් වූ අතර එය වර්ෂ 02 ක් ඉක්මවා තිබුණද මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

## 1.6 යහ පාලනය හා ගිණුම් කටයුතු භාවය

### 1.6.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක:පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 3 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත්, එම සැලැස්ම පිළියෙල කර තිබුණේ 2010 අප්‍රේල් 25 දිනදීය. එහි පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශිය ලේකම් කාර්යාල සඳහා වෙන වෙනම සංයුක්ත සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුබද්ධිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 ක් පැවතුණද එම කාර්යාල වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කළයුතු කාර්යයන් සැලසුම් කර ගන්නා ආකාරය පිළිබඳව මෙම සංයුක්ත සැලැස්මෙහි සඳහන් කර නොතිබුණි.

### 1.6.2 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

ඉහත 1.6.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර තිබුණද, සංයුක්ත සැලැස්ම සෑම අංශයක්ම ආවරණය වන පරිදි පිළියෙල කර නොතිබීම හේතුවෙන් ක්‍රියාකාරි සැලැස්මෙහිද එම අඩුපාඩු නිරීක්ෂණය විය.

## 1.7 කළමනාකරණ දුර්වලතා

එකවර නිකුත් කර තිබුණු පොදු 172 කුවිතාන්සි පොත් 05 ක් පාවිච්චි කරමින් තිබියදී මධ්‍යම රජයට හා පළාත් සභාවට අයත් තවත් පොදු 172 කුවිතාන්සි පොත් 7 ක් ද මුදල් භාරකරු වෙත

නිකුත් කර ඇති බව 2012 දෙසැම්බර් 14 දින සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

**1.8 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 63 | 58 | 05 |
| (ii) | ද්විතික මට්ටම | 1481 | 1257 | 224 |
| (iii) | තෘතිය මට්ටම | 43 | 31 | 12 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 170 | 163 | 07 |
| | එකතුව | 1757 | 1509 | 248 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 248 පැවතියද එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.